# ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීම සඳහා සමෘද්ධි ව්‍යාපාරයේ දායකත්වය පිළිබඳ විමසුමක්

එච්.එම්.එන්. දිල්හානි හේරත්[1]

## සංක්ෂේපය

තෙවැනි ලෝකයේ රටවල් සුභසාධන ක්‍රම මගින් සංවර්ධනය වෙත අවතීර්ණ වීමට උත්සහ ගැනීම පිළිබඳ ඉතිහාසය 1930 දශකයෙන් පමණ ඇරඹේ. එසේ නමුත් මෙම රටවල පුරාතනයේ සිටම විවිධ සුභසාධන ක්‍රම පැවතිණි. ලෝක සන්දර්භය තුළ සුභසාධනය නම් සංකල්පය පිළිබඳ නූතනයේ පෙරටත් වඩා අවධානය යොමු වී තිබේ. මානව සුභසිද්ධිය සඳහා අවශ්‍ය මිනිසුන්ගේ මූලික මූලික අවශ්‍යතා සපුරාදීමට අදාළ ප්‍රතිපත්ති නිර්මාණය සහ ඒවා ක්‍රියාත්මක කිරීම සමාජ සුභසාධන ක්‍රියාවලියට ඇතුළත් වේ. ඒ අනුව නිදහස ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාවේ බලයට පත්වූ රජයන් ජනතාවගේ ජීවන මට්ටම් නගා සිටුවීම සඳහා විවිධ සංවර්ධන උපාය මාර්ගයන් ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා ක්‍රියාවට නංවන ලද වැඩසටහන් අතර 1994 වර්ෂයේදී රජය විසින් ජනතා සහභාගීත්වයෙන් යුත් සංවර්ධන වැඩසටහනක් ලෙස දුප්පත්කම තුරන් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ජාතික වැඩසටහන වූයේ සමෘද්ධි ව්‍යාපාරයයි (ජයසිංහ, 28). සමෘද්ධි ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව විමසීම මෙම ලිපියේ අරමුණයි .මේ සඳහා ද්වීතියික දත්ත ලෙස ශ්‍රී ලංකා මහබැංකු වාර්තා, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය මගින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශන, සමෘද්ධි අධිකාරිය සම්බන්ධ ලිපි හා වාර්තා, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තා, දිවිනැගුම පනත ආදිය භාවිතා කර ඇත. දිළිඳු ජනතාවගේ සුභසාධනය සහ ග්‍රාම සංවර්ධනය උදෙසා විශාල දායකත්වයක් සමෘද්ධි ව්‍යාපාරය මගින් සිදුකර ඇතත්, මෙම වැඩසටහන් සැලසුම් කිරීමේදී බිම් මට්ටමේ අදහස් නොවිමසීම, මෙම වැඩසටහන් තුළින් දේශපාලන අභිලාශයන් ඉටුකර ගැනීමට කටයුතු කිරීම, ප්‍රතිලාභි ප්‍රජාව යැපීම් මානසිකත්වයකින් කටයුතු කිරීම, සමාජ සජීවිකරණය තුළ පවතින ගැටලු නිසා දරිද්‍රතාවය ග්‍රාමීය මට්ටමින් තවදුරටත් දැකගත හැකිවේ.

**මුඛ්‍ය පදඃ** *සුභසාධනය, සහනාධාර, ප්‍රතිලාභී පවුල්, සංවර්ධනය, ආධාර, සමෘද්ධි ව්‍යාපාරය*

## හැඳින්වීම

1993 වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය දශලක්ෂ 17.6 ක් වූ අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 1.2% ක් විය. ජනගහනයෙන් 72.3% ක් ග්‍රාමීය අංශයෙහිද, 21.4% ක් නාගරික අංශයෙහිද, 6.3% ක් වතුකරයෙහිද විය. ජනගහනයෙන් 65%-70% අතර ප්‍රමාණයක් දිළිඳු බවින් පෙළෙන අතර, ඉන් 25%-30% අතර ප්‍රමාණයක් වඩාත් දිළිඳු අය වූහ. දිළිඳු අයගෙන් 80%ක් ම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වීම ශ්‍රී ලංකා ආර්ථිකයේ කැපී පෙනෙන ලක්ෂණයකි. එම නිසා මේ අවධියේ රජයේ දැඩි අවධානය ග්‍රාමීය සංවර්ධනය වෙත යොමු කිරීම අත්‍යවශ්‍යය ලක්ෂණයක් විය (අඳුරට ආලෝකයක්, 1994: 1). ඒ වගේම උසස් සාක්ෂරතාව, දිගුකල් ජීවත්වීමේ හැකියාව, ළඳරු මරණ අනුපාතිකය ආදී දර්ශක අනුව සලකා බලන කල තෙවැනි ලෝකයේ අන් රටවල්වලට වඩා දියුණු තත්ත්වයක් පෙන්නුම් කළ ද, විරැකියාව හා දුප්පත්කම හේතු කොට ගෙන පැන නැගී ඇති බලවත් සමාජ ආර්ථික ප්‍රශ්න රැසකට ශ්‍රී ලංකාව මුහුණ පා ඇත (ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1999: 1). මෙවන් තත්ත්වයක් තුළ 1994 මහ මැතිවරණය සඳහා පොදු ජන එක්සත් පෙරමුණ විසින් ඉදිරිපත් කරන ලද මැතිවරණ ප්‍රකාශයේ ඇතුළත්වූ එක් වැදගත් පොරොන්දුවක් වූයේ මෙරට දිළිඳුකම පිටු දැකීමේ වැඩසටහනක් ලෙස සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක කරන බවය. දිළිඳුකම පිටු දැකීම සඳහා දිළිඳු සහන බෙදා දීමට වඩා විශාල වැඩකොටසක් කළ යුතු බව එම රජය හඳුනාගෙන තිබූ නිසාත් එවැනි වැඩසටහනක් සඳහා

[1] ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා (විශේෂ) තෙවන වසර

අධිකාරි බලයක් ඇති ආයතන රටාවක හා සංවිධානයක අවශ්‍යතාව මැනවින් වටහාගත් රජය සමෘද්ධි කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි අධිකාරිය පිහිටුවා සහනාධාර බෙදා දීමට අමතරව විශාල සංවර්ධන ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය පියවර ගනු ලැබීය. ප්‍රථම වතාවට දිළිඳුකම පිටු දැකීම හා ග්‍රාමීය සංවර්ධනයේ නායකත්වය තරුණයන් හට ලබාදීම මඟින් මෙරට තරුණ පරම්පරාව මෙරට සංවර්ධන ක්‍රියාවලියේ මාර්ගෝපදේශකයන් කිරීමට සමෘද්ධි ව්‍යාපාරය හරහා ගනු ලැබූ ක්‍රියා මාර්ගය ලෝකයේ සියලුම සංවිධානයන්ගේ පැසසුමට හා අවධානයට ලක්වුණි. සමෘද්ධි ව්‍යාපාරය හුදෙක් දිළිඳු සහන බෙදා දීමේ වැඩසටහනක් පමණක් නොවේ. එය දැවැන්ත ආර්ථික සහ සමාජීය සංවර්ධන ව්‍යාපාරයක් වෙයි. සමාජ සජීවිකරණය හරහා දිළිඳු ජන කොටස් සංවිධානය කිරීම, ඔවුන් සමාජ සංවර්ධනයට යොමුකරවීම, සේවා නියුක්ති අවස්ථාවන් වර්ධනය කිරීම සහ සේවා වියුක්ති ප්‍රශ්නය විසඳා ගැනීම, ජනතාව තුළ ඉතිරිකිරීමේ පුරුදු වැඩිදියුණු කිරීම සහ ස්වයං රැකියා මඟින් ආදායම් උපයා ගැනීමේ හැකියාව වැඩිකරමින් ස්වෝත්සාහයෙන් නැගී සිටීමේ හැකියාව වර්ධනය කිරීම, පුළුල් හා සමාජීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සමාජ අපචාර මත්ද්‍රව්‍ය වැරදි ඇබ්බැහිවීම්වලින් ජනතාව මුදවා ගැනීම මෙන්ම සමෘද්ධි ව්‍යාපෘති මාර්ගයෙන් ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම වැනි අතිවිශාලවූත් පුළුල්වූත් ව්‍යාපාරයක් ලෙස ආරම්භ විය. මේ අනුව 1995 අංක 30 දරණ සමෘද්ධි අධිකාරි පනත යටතේ ස්ථාපිත වූ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය 1996 පෙබරවාරි මස 01 වන දින සිට කටයුතු ආරම්භ කරන ලදී (සමෘද්ධි සමාජ ආරක්ෂණය, 1999: 1). වර්තමානය වනවිට 1995 අංක 30 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1996 අංක 18 දරණ පනත මඟින් පිහිටුවා තිබූ දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි තුන සහ උඩරට ගැමි පුනුරුත්ථාපන දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙක ද, ඇතුලුව රාජ්‍ය ආයතන 05ක් ඒකාබද්ධ කරමින් 2013 අංක 01 දරණ දිවිනැගුම පනත මඟින් දිවි නැගුම වැඩසටහන හඳුන්වාදී ඇත.

## සමෘද්ධි වැඩසටහනේ උප පද්ධති

සමෘද්ධි වැඩසටහන පද්ධතිමය ස්වභාවයක් උසුලයි. මිනිස් සිරුරේ එක් පද්ධතියක ඇණහිටීමක් සිදුවුවහොත් එය සෙසු පද්ධතීන්ට ද බලපෑම් ඇති කරයි. මේ ආකාරයට සමෘද්ධි වැඩසටහනේ ද, උප පද්ධතීන් 04 ක් හඳුනාගත හැකිය. එම උප පද්ධති තමාටම ආවේණික ක්‍රියාවලියක නිරතවන අතර, සෙසු උප පද්ධතීන්ට ද එහි බලපෑම් කරයි. උදාහරණ ලෙස කණ්ඩායමට නමැති උප පද්ධතිය තුළ සති අන්ත සාකච්ඡා, ණය අනුමැතිය, මුදල් ඒකරාශිකරණය ආදි සාමූහික ක්‍රියාකාරකම් ඇණහිටුවන විට සමෘද්ධි සමිති උප පද්ධතිය දුර්වල වේ. එහි බලපෑම මුළු බැංකු පද්ධතියටම මෙන්ම මහා සංගම් උප පද්ධතියටද බලපෑම් ඇති කරයි. මේ අනුව ප්‍රජා නායකත්ව ක්‍රියාවලියක් හරහා සමස්ත ප්‍රජාවම බලගැන්වීම සඳහා වැඩපිළිවෙළක් ගොඩනැගී ඇත (දිසානායක, 2016: 34). ඒ ආයතන හතරෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් වේ.

### සමෘද්ධි සමිතිය

ග්‍රාම සේවා වසම් මට්ටමින් පිහිටුවා ගන්නා කුඩා කණ්ඩායම් සියල්ලම එකට එක් කොට ගොඩනගන කුඩා කණ්ඩායමට එහා ගිය මධ්‍යගත ප්‍රජා සංවිධානය සමෘද්ධි සමිතියයි. සෑම කුඩා ගම්මානයකම ජීවත් වන සියලුම දුප්පතුන් ඒකරාශී වී සමෘද්ධි සමිතිය සකස් වේ. මෙසේ තම වසම තුළ සියලුම කුඩා ගම්මාන සඳහා සමෘද්ධි සමිති ගොනුවන්නට සැළැස්වීමත් එම සමිති විධිමත්ව පවත්වාගෙනයාමත් සමෘද්ධි සංවර්ධන (දිවිනැගුම සංවර්ධන) නිලධාරීන්ගේ භූමිකාවයි. එහි නායකත්වය තෝරාගනු ලබන්නේ තම බල ප්‍රදේශයේ පවත්නා කුඩා කණ්ඩායම් සාමාජිකත්වය අතුරිනි. ගම්වල ඇති අනෙක් බොහෝ සාම්ප්‍රදායික සමිතිවල සභාපතීත්වය උසුලන්නේ බොහෝ විට දුප්පත් නොවන අයෙකි. එවැනි අයෙකුගේ නම යෝජනා කරන්නේද දුප්පතෙකි. සමාජයේ මුල් බැසගත් සිතුම් පැතුම් වන්නේ සභාපති තනතුර පිළිගත් පවුලක පිළිගත් උගත් අයෙකකුට ලැබිය යුතුය යන්නයි. ගමේ සාම්ප්‍රදායික සමිතියකදී දුප්පතුන් 80%ක් පමණ සිටියත් දුප්පතුන් නොවන 20% අතරින් නිලධාරියෙක් පත්කර ගැනීමට දුප්පතුන් පෙළඹේ. මෙම තත්ත්වය වෙනස් කර ග්‍රාමීය

දුප්පත් ජනතාව අතරින් නායකත්වය මතුකර ගැනීමට සමෘද්ධි සමිතිය හොඳ වේදිකාවකි (වික්‍රමරත්න, 2001: 07). ග්‍රාමසේවා වසමක සමෘද්ධි සමිති එකක් හෝ ඊට වැඩි ගණනක් තිබිය හැකිය. ජන අනුපාතය, ජන වර්ගය, භූගෝලීය පිහිටීම ආදී හේතූන් පදනම් කරගෙන වසමක පිහිටුවන සමිති ගණන තීරණය වේ. සමිතියේ ප්‍රධානියා සභාපති වන අතර ලේකම්වරයා ද ගමේ කණ්ඩායම අතුරින් තෝරා ගනී. කණ්ඩායමේ අරමුදල් රැස් කිරීම, ණය අනුමැතිය, කණ්ඩායම් ප්‍රගති සාකච්ඡා කිරීම, සහය සේවා ළං කිරීම ආදී කටයුතු මෙහිදී සිදු වේ. දිළිඳු ජනතාවගේ ආර්ථික සමාජ සංවර්ධනයට අදාළ එකම සංවර්ධන ආයතනය ලෙස මෙය හඳුනාගෙන ඇත. ග්‍රාමීය සංවර්ධනයේ පොදු යටිතල පහසුකම් ආදිය සිදු කිරීමේ දී එය ක්‍රියාත්මක කරන ආයතනය ලෙස සමෘද්ධි සමිතිය ගොඩනැගී ඇත. මෙම සමිති සඳහා සම්බන්ධීකරණය භාරව කටයුතු කරනු ලබන්නේ වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරීවරයා වේ (දිසානායක, 2016: 35).

### කුඩා කණ්ඩායම

මෙම පස් දෙනාගේ කණ්ඩායම සමෘද්ධි ව්‍යාපාරය නැමති මන්දිරයේ අත්තිවාරම ලෙස සඳහන් කළ හැකිය. කුඩා කණ්ඩායම යනු නිශ්චිත අරමුණක් සහිතව සාමාජිකත්වයේ පොදු එකඟත්වය මත පිහිටුවා ගන්නා කුඩාම ප්‍රජා සංවිධානයයි. මෙහිදී එක් පස් දෙනෙකු එකතුවන ආකාරයත්, එම කණ්ඩායම්වල ක්‍රියාකාරකම් පිළිබඳවත් සමෘද්ධි සංවර්ධන නිලධාරින් විසින් දැනුවත් කළ පසු තමන්ට ගැලපෙන තවත් හතර දෙනෙක් තෝරා ගැනීමට ඔවුන්ටම අවස්ථාව දී එසේ එක්වන කුඩා කණ්ඩායම්වල නිරන්තර ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සමෘද්ධි සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ වගකීමයි. ඒ වගේම කණ්ඩායම් ක්‍රියාවලියේදී තීරණ ගැනීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී යම් යම් ගැටලුකාරී තත්ත්වයක් මතු වුවහොත් එය පොදු එකඟතාවයෙන් විසඳාගෙන ඉදිරියට යන්නට පස් දෙනාගේ සාමාජිකත්වය පිටුවහලක් වනු ඇත. කුඩා කණ්ඩායමක් ගොඩනැගීමේදී සම අදහස් ඇති අයවීම, සම ආර්ථික හා සමාජ පසුබිමක් ඇති අයවීම හා ආසන්නයේ සිටින අයවීම ඉතාම වැදගත් වේ. එයට හේතුව සමජාතියේ අය එකට ගොනුකර පවත්වාගෙන යාම පහසුවන බැවිනි (වික්‍රමරත්න, 2001: 7). මෙම කුඩා කණ්ඩායමක් තුළ සාමූහික ක්‍රියාකාරකම් ී රැසක් සිදුවේ. එනම් සති අන්ත සාකච්ඡාව, අරමුදල ගොඩනැගීම, ප්‍රගතිය ඇගයීම, ශ්‍රම හුවමාරු වැඩසටහන්, අත්තම් ක්‍රමය සහ ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වශයෙනි. මෙහිදී කණ්ඩායම සතියකට වරක් හෝ දෙකකට වරක් රැසවේ. රැස් වී ප්‍රජාතාන්ත්‍රීය ලෙස අදහස් හුවමාරු කර ගනී. සැමගේම අදහස් උදහස් යෝජනාවලට වටිනාකමක් ඇත. ඒ වගේම කණ්ඩායම තුළ ගොඩනැගෙන අරමුදල කණ්ඩායමේ තිරසාර පැවැත්ම සඳහා ප්‍රබල බලවේගයකි. කණ්ඩායම් අරමුදලක් ගොඩනැගීමේ අරමුණු කිහිපයකි. එනම් ඉතිරි කිරීම සඳහා යොමු කිරීම, සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩනැගීම, කණ්ඩායම් සාමූහිකත්වය ගොඩනැගීම, සාමාජිනයන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා පිහිටුවීම, සුළු පරිමාණයේ ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ණය ලබා ගැනීම, ක්‍රමානුකූල ණය ගැනීම් හා ගෙවීම් විනයක් ඇති කිරීම සහ කණ්ඩායම් ආයෝජන දිරිගැන්වීම ආදියයි. කණ්ඩායම් අරමුදලක් ආරම්භ කිරීමේ අදහස සහ එය ප්‍රමාණය කොපමණද යන්න කණ්ඩායම තුළින්ම මතු කර ගන්නා අදහසකි. එය සතියකට රු.10ක් රු. 15ක් එසේත් නැත්නම් මසකට වරක් රු. 50ක් ආදී වශයෙන් සමාජිකත්වයේ පොදු මතය අනුව තීරණය විය හැකිය. කණ්ඩායමේ කළමනාකරණ භාර වගකීම පැවරෙන්නේ කණ්ඩායම තුළින්ම මතුවන නායකයාටය (දිසානායක, 2016: 35). කණ්ඩායමේ අරමුදල් ප්‍රමාණයෙන් වැඩි වෙත්ම සාමාජිකත්වයේ කැමැත්ත මත සුළු සුළු ණය මුදාහැරේ. ඔවුන් එමගින් ක්‍රමානුකූලව ඉතුරුම් ප්‍රවර්ධනයට හා ණය සංස්කෘතියට යොමු වේ.

### මහා සංගමය හා පාලක මණ්ඩලය

මහා සංගමය ලෙස හැඳින්වෙන්නේ සමෘද්ධි වැඩසටහනේ ප්‍රජා සංවිධාන ජාලයේ මුදුන් සංවිධානයයි. මුළු බැංකු සංගම් ව්‍යාපාරය වෙනුවෙන්ම ප්‍රතිපත්තිමය තීරන ගන්නා ඉහළම මණ්ඩලය වන්නේ 21 දෙනෙකුගෙන් සමන්විත සමෘද්ධි මහා සංගමයේ විධායක කමිටුවයි. ප්‍රජාතන්ත්‍රවාදී අන්දමට වාර්ෂික සම්මේලනයක් මඟින් විධායක කමිටුව පිහිටුවා ගනී. විධායක කමිටුවට කිසිම සාමාජිකයෙක් බාහිර නම් කිරීමක් යටතේ පත් නොවේ. වාර්ෂික සම්මේලනයට බල ප්‍රදේශය තුළ කුඩා ගම්මාන මට්ටමේ සමෘද්ධි සමිතිවල සභාපතිවරුන් සහභාගි වේ. විධායක

කමිටුවේ සභාපති තෝරා ගනු ලබන්නේ 21ක් දෙනෙකුගෙන් සමන්විත විධායක කමිටුවේ සභාපතිවරුන්ගේ එකඟත්වය හා කැමැත්ත මතයි. ඔහු විධායක කමිටුවේ මුලසුන දරයි. මෙහි ලේකම් වන්නේ කළමනාකාර අධ්‍යක්‍ෂවරයාය. තවද මෙම විධායක කමිටු සාමාජිකයින් 21 දෙනා අතුරින් සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම් හා භාණ්ඩාගාරික යන අයද තෝරා ගනු ලබන්නේ මහ සංගමයේ සංමේලනයේ සාමාජික කැමැත්ත මතය. සමෘද්ධි මහ සංගම් ව්‍යවස්ථාවේ 08 (05) වගන්තිය අනුව, මෙම තනතුරු පහ සඳහා පත්විය හැක්කේ එක් වර්ෂයක කාලයක් සඳහා පමණි. සමෘද්ධි මහා සංගමයේ සියලුම කටයුතු මෙහෙයවීම, අධීක්‍ෂණය සිදු කරනු ලබන්නේ විධායක කමිටුවේ අනුමැතියට යටත්වය. තම බල ප්‍රදේශයේ ජීවත් වන දිළිඳු ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් පෙනී සිටින ඔවුනට වග කියන ප්‍රජා කේන්ද්‍රීය ආයතනයක් ලෙස මෙම මහ සංගමය හැඳින්විය හැකිය (මිත්‍රරත්න, 1999: 3-4). සමෘද්ධි මහා සංගමයේ කාර්යභාරය පිළිබඳ සාකච්ඡා කිරීමේදී සමෘද්ධි මහා සංගමයේ කාර්යාලය මඟින් විධායක කමිටුව මඟින් ගන්නා ලබන තීරණ ක්‍රියාත්මක කරනු ලැබේ. සමෘද්ධි මහ සංගම්වල අරමුණු ව්‍යවස්ථාවේ 6වන වගන්තියේ විස්තර කර ඇත. එනම් අඩු අදායම්ලාභී නිෂ්පාදන හා සේවා වර්ධනය කිරීම සඳහා (සමෘද්ධි බැංකු මඟින්) අවශ්‍ය ණය හා රක්‍ෂණ ආවරණය ඇති කරමින් ආර්ථික වර්ධනය, දුප්පතුන් සමාජ සජීවීකරණ ක්‍රියාවලියට හසුකරමින් අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා පස් දෙනාගේ කණ්ඩායම් හා සමෘද්ධි සමිති ස්ථාපිත කිරීම, කුඩා කණ්ඩායම්, සමෘද්ධි සමිති, බැංකු සංගම් හා මහා සංගම් ආදී දුප්පතුන් විවිධ තලවලදී සංවිධානය කිරීම හා ආයතනගත කිරීම, අඩු ආදායම්ලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය, අඩු ආදායම්ලාභීන්ගේ දේශපාලනමය ශක්තිය වර්ධනය හා ඔවුන්ගේ මන්දපෝෂණය පිටු දකිමින් කායික, මානසික, සමාජීය සෞඛ්‍ය වර්ධනය කිරීම ආදී කාර්යයන් වේ. මේ අනුව පැහැදිළි වන්නේ තම බල ප්‍රදේශයේ ජීවත් වන දිළිඳු ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් පෙනී සිටින ඔවුන්ට වග කියන ප්‍රජා කේන්ද්‍රීය ආයතනයක් ලෙස සමෘද්ධි මහා සංගමය සඳහන් කළ හැකි බවයි.

සමෘද්ධි බැංකු සංගමයේ වැදගත්ම මෙහෙයුම් ආයතනය වන්නේ පාලක මණ්ඩලයයි. මෙහි සභාපතිවරයා වන්නේ ප්‍රජාව අතුරින් මතුවන ප්‍රජා නායකයෙකු වීම විශේෂත්වයකි. ඔහු පාලක මණ්ඩලයේ ප්‍රධානියා වේ. මුලසුන හොබවන්නේ ද, සභාපතිවරයා ය. මෙහි ලේකම් නිල බලයෙන්ම බැංකු කළමනාකරුය. පාලක මණ්ඩලයේ කාර්යභාරය පිළිබඳ සාකච්ඡා කිරීමේදී බැංකු සංගමයේ සියලුම කටයුතු මෙහෙයවීම සහ අධීක්‍ෂණය, ණය අනුමැතිය, ණය අයකර ගැනීමේ ප්‍රගතිය විමසා බැලීම, සියලුම බැංකු වියදම් අනුමැතිය, සහය සේවා ළඟාකර දීම, මහා සංගමය සමඟ අන්තර් සම්බන්ධතාවක් පවත්වාගෙන යෑම සහ ප්‍රජාව වෙනුවෙන් වගකීම හා ඔවුන්ගේ සංවර්ධනයට මැදිහත්වීම ආදියයි (දිසානායක, 2016: 36-37). මේ අනුව බැංකුවේ සියලුම ක්‍රියාකාරකම් මෙහෙයවන ප්‍රජා යාන්ත්‍රණය බැංකු පාලක මණ්ඩලය ලෙස සඳහන් කළ හැකිය.

සමෘද්ධි වැඩසටහනේ ක්‍රියාත්මක වන මීළඟ උප පද්ධතිය වන්නේ සමෘද්ධි බැංකුවයි. එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශවලදී සාකච්ඡා කරේ. මේ අනුව පැහැදිළි වන්නේ සමෘද්ධි වැඩසටහනේ ක්‍රියාත්මක වන මෙම උප පද්ධතීන් තමාටම ආවේණික ක්‍රියාවලියක නිරත වන අතර, සෙසු උප පද්ධතීන්ට ද, එහි බලපෑමක් ඇති කරමින් එකිනෙකට බැඳුණු නායකත්ව වළල්ලක් සේ ක්‍රියාත්මක වන බවයි.

## සමෘද්ධි ව්‍යාපාරය මඟින් ක්‍රියාත්මක වන ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශ

දිළිඳුකම පිටුදැකීමත්, සමෘද්ධිමත් දේශයක් ගොඩනැගීමත් සමස්ත සංවර්ධන ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් වේ. විශේෂයෙන්ම සාර්ව ආර්ථික ප්‍රතිඵලවල සාර්ථකත්වය, ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන තත්ත්වය මේ කෙරෙහි ප්‍රබල ලෙස බලපානු ලැබේ. නමුත් සාර්ව ආර්ථික සංවර්ධන උත්සාහයන්ට අතිරේකව දිළිඳුකම පිටුදැකීමේ සුවිශේෂ වැඩසටහන්වල අවශ්‍යතාව ද, ලෝක බැංකුවේ පවා පිළිගැනීමට ලක්වී ඇත. ඊට ප්‍රධාන හේතුවක් වූයේ ඉහළින් පහළට බේරී එන සංවර්ධන ක්‍රියාදාමය පසුගිය දශක ගණනාව තුළ ලැබූ පරාජයන්ය. ලෝක බැංකු සභාපතිවරයා පවා මෙම තත්ත්වය මෑත කාලයේදී පිළිගෙන තිබීම විශේෂ වේ. මේ අනුව සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඒ තුළ ප්‍රධාන සංවර්ධන ප්‍රවේශ තුනක් පැහැදිළිව දක්නට ලැබේ. මෙම

ප්‍රවේශය ඓතිහාසිකව ලංකවේ ඇතිවූ සංවර්ධන උත්සාහයන් පිළිබඳ අත්දැකීම් ගලපා ගැනීමේ හා දිළිඳුකම පිටුදැකීමේ පාඩම් සම්බන්ධ කරගැනීමට ගත් උත්සාහයන් ලෙස හැඳින්වීමට පුළුවන (මිත්‍රරත්න, 2000: 7). මෙම සටහනේ දැක්වෙන අන්දමට සුභසාධන ප්‍රවේශය පළමු වේ. ග්‍රාම සංවර්ධන ප්‍රවේශය දෙවෙනි සංවර්ධන උත්සාහය වේ. තුන්වන ප්‍රවේශය සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරය නොහොත් දුප්පතුන් බලගන්වන ප්‍රවේශය වේ. ඒවගේම සුළු ගොවිතැනක් හෝ සුළු වෙළදාමක් කරගෙන යන සහනාධාරලාභියෙකුට බැංකු සංගමයෙන් ගන්නා ණය මුදල් මෙන්ම මාර්ග පහසුකම් ලබාදීම, ඇළවේලිවලින් ජලය ලබාගැනීම ද, වැදගත් වේ. එහෙයින් ග්‍රාම සංවර්ධන ප්‍රවේශය යටතේ කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධනය ඔවුන්ගේ දිළිඳුකම පිටුදැකීමට විශාල රුකුලක් වේ. මේ අනුව මෙම ප්‍රවේශ වෙන වෙනම විග්‍රහ කලත් මෙම ප්‍රවේශ අතර අන්තර් සම්බන්ධතාවක් ඇති බව සඳහන් කළ හැකිය (මිත්‍රරත්න, 1999: 7). මේ අනුව සමස්තයක් ලෙස ග්‍රාම සංවර්ධනය කෙරෙහි මෙම ප්‍රවේශ තුනම එක ලෙසින් ඉවහල් වන බව මෙහිදී පැහැදිලි වේ. එමනිසා මෙම ප්‍රවේශ තුන ග්‍රාම සංවර්ධනයට දායක වන ආකාරය පිළිබඳව වෙනනම සාකච්ඡා කිරීම වැදගත් වේ.

## සුභ සාධන ප්‍රවේශය

තෙවන ලෝකයේ රටවල් හා සසඳන විට ලංකාව දිගින් දිගටම ක්‍රියාත්මක කළ සුභ සාධන ප්‍රතිපත්තිය එහි අනන්‍යතාවක් බවට පත්වී ඇත. මෙවැනි සුභසාධක ප්‍රතිපත්තියක් කිරීමට හේතු මොනවාදැයි යන්න සොයා බැලීම වැදගත්ය. බටහිර යුරෝපීය රටවල යුද්ධ කාලයේ ඇති වූ මහා ආර්ථික පරිහානිවලට එක් පිළියමක් ලෙස ඉදිරිපත් වූයේ මිනිසුන් අතරට භාණ්ඩ මිළදී ගැනීමේ ශක්තිය වැඩි කිරීම සඳහා මුදල් යැවීමය. මේ සඳහා සුභ සාධන රාජ්‍ය සංකල්පයක් ඉදිරිපත් විය. මෙම අදහස් ඉදිරිපත් කිරීමේදී කේන්ස් සාමි වරයා ඉතා වැදගත් විය. මෙම සුභ සාධන සංකල්පය ලාංකික දේශපාලන ක්ෂේත්‍රයට බලපාන ලදී. මෙය සුභ සාධන ප්‍රතිපත්තියක් ඇතිවීමට එක් හේතුවක් ලෙස දැක්වීමට පුළුවන. තවද බ්‍රිතාන්‍ය සුභ සාධන රාජ්‍යයේ ප්‍රධාන කුළුණු තුනවන අධ්‍යාපන පනත, ජාතික රක්ෂණ පනත හා ජාතික සෞඛ්‍ය සේවය හා සමාජසේවා පනතෙන් ඇතිකළ සුභ සාධන කටයුතු ලෙස දැක්විය හැකිය. මෙම ආභාසය අනුව යමින් සමෘද්ධි ව්‍යාපාරය තුළද සුභසාධන ප්‍රවේශයක් ක්‍රියාත්මක කළේය. සමෘද්ධි වැඩසටහනේ සුභ සාධන ප්‍රවේශයේ එක් වැදගත් අංගයක් වන්නේ මාසිකව සහනාධාරයක් දුප්පත් පවුල් වෙත ලබාදීමයි (මිත්‍රරත්න, 2000: 11). මෙහිදී ආර්ථික හා සමාජ සමීක්ෂණයක් තුළින් දුප්පත් පවුල් හඳුනාගැනීමක් කරනු ලැබේ. රු. 1000/- කට වඩා අඩුවෙන් මාසික ආයමක් ලබන පවුල් මෙම සහනාධාර ලැබීමට තෝරාගෙන ඇත. ඊට අමතරව කලින් රජයේ ජනසවි ආධාර ලැබූ පවුල්වලටද රු. 250/- ක මාසික දීමනාවක් ගෙවා ඇත. මෙහිදී පවුලේ ආදායම මෙන්ම පවුලේ සංඛ්‍යාව ද, ආධාර ලබාදීමේදී සැලකිල්ලට ගෙන ඇත. මේ අනුව පවුලක දෙදෙනෙකු පමණක් ඉන්නා විට රු. 200/- ආධාරයක්ද, පවුලක එක් සාමාජිකයකු පමණක් ඉන්නාවිට රු. 100/- ක සහනාධාරයක්ද ලබාදේ. රු. 1000/- ක් ගෙවනු ලැබුවේ ඉතාමත් දුප්පත් පවුල්වලට පමණි (ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 2000: 11) මේ අනුව පවුල් ලක්ෂ 18 කට ආසන්න ප්‍රමාණයකට වාර්ෂිකව රුපියල් කෝටි 800 කට ආසන්න මුදල් ප්‍රමාණයක් රජය වැය කර ඇති බව පහත දත්ත අනුව පැහැදිලි වේ.

වගු අංක 01: 1999.06.30 දිනට සමෘද්ධි සහනාධාර ලබාදීම

| මුදල රු. | පවුල් සංඛ්‍යාව | මුළු වියදම (රු.මි) |
|---|---|---|
| රු. 1000 | 13669 | 13.66 |
| රු. 500 | 889314 | 444.65 |
| රු. 250 | 330199 | 82.54 |
| රු. 200 | 323354 | 64.67 |
| රු. 100 | 212385 | 21.23 |
| **එකතුව** | 1768921 | 626.75 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1999

මෙසේ පාරිභෝජන සහන දීමනා ලැබූ පවුල් සංඛ්‍යාව පසුකාලීනව වැඩිවූ අතර පරිභෝජන සහන දීමනාව වැඩිකරන ලදී. ඒ අනුව 2000 අගෝස්තු මාසයේ සිට රු. 500 ලැබූ පවුල්වලට රු. 700 දක්වා ද, රු. 200 ලැබූ පවුල්වලට රු. 350 දක්වා ද, රු. 100 ලැබූ පවුල්වලට රු. 250 දක්වා ද, වැඩි කළ අතර රු. 1000ක් ලැබූ පවුල් වල දීමනාව ස්ථාවරව පවත්වා ගන්නා ලදී. ඒ හැරුණු විට ජනසවිලාභී පවුල්වලට සැපයූ රු. 250 දීමනාව රු. 400 දක්වා වැඩි කරන ලදී. තවද දිළිඳු සහන දෙපාර්තමේන්තුව විසින් උතුරු නැගෙනහිර පළාත්වල අවතැන්වූ පවුල් සඳහා රු. 336ත් රු. 1260 ත් අතර ප්‍රමාණයක වියළි ආහාර ප්‍රමාණයක් සපයන ලදී. සමෘද්ධි ව්‍යාපාරය යටතේ ආදායම උපයා ගැනීමේ හැකියාව වැඩිකරගත් පවුල් තවදුරටත් මෙම ව්‍යාපාරය තුළ රඳවා තබාගැනීම සඳහා එක් පවුලකට රු. 140ක දීමනාවක් ගෙවන ලද අතර මෙම රුපියල් 140න් රු. 100ක් අනිවාර්ය ඉතුරුම් වශයෙන් ද, රු. 30ක් සමාජ ආරක්ෂණ දායක මුදල් වශයෙන් ද, රු.10ක් සමෘද්ධි ලොතරැයිය සඳහා ද, වැය කිරීමට කටයුතු කර ඇත. 2002 ඔක්තොම්බර් මාසයේදී සම්මත කළ සුභසාධන ප්‍රතිලාභ පනත මඟින් සමෘද්ධි දීමනාවන් වඩාත් විනිවිද හා තාර්කිකභාවයට පත්කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළ අතර මෙම පනත යටතේ සමෘද්ධි වැඩසටහනට ඇතුළත් වී සිටින ප්‍රතිලාභ ලබා ගැනීමට නුසුදුසු පවුල් ඉවත් කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම 2002 වර්ෂයේදී සමෘද්ධි ව්‍යාපාරය තුළ වෙනස්කම් කීපයක්ම කරන ලදී. එනම් 2002 මැයි මාසයේ සිට සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුලක් ලෙස සුදුසුකම් ලැබීමට පැවතිය යුතු අවම මාසික ආදායම රු. 1000 සිට රු. 1500 දක්වා වැඩිකිරීම, සමෘද්ධි ගෙවීම් සඳහා එක් එක් දිස්ත්‍රික්කයට වෙන් කළ මුදලින් 25%ක් අඩු කිරීම, ප්‍රචණ්ඩ ක්‍රියා පැවති කාලවලදී අතුරුදහන් වූ පුද්ගලයන් සිටි පවුල්වලට සහ උතුරු නැගෙනහිර සේවයේ නියුතු පුද්ගලයින්ගේ පවුල්වලට නිකුත් කළ සලාක අවලංගු කිරීම, රු. 700 වටිනාකමකින් යුක්ත සමෘද්ධි සහනාධාර දීමනාව රු.600 දක්වා අඩු කිරීම යන වෙනස්කම් සිදුකරන ලදි (හෙට්ටිආරච්චි, 2008: 5).

වගු අංක 02: 2009 සිට සමෘද්ධි සහනාධාරලාභී පවුල් සංඛ්‍යාව

| **වර්ෂය** | **සමෘද්ධි ප්‍රතිලාභී පවුල් ගණන** |
|---|---|
| 2009 | 1,600,786 |
| 2010 | 1,572,129 |
| 2011 | 1,541,575 |
| 2012 | 1,549,107 |
| 2013 | 1,477,313 |
| 2014 | 1,479,811 |
| 2015 | 1,453,078 |

මූලාශ්‍රය: දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, 2015

මේ ආකාරයට 1995 සිට සමෘද්ධි සහනාධාර, දීමනා පත්‍රයක ලෙස නිකුත් කිරීම සිදු කළ ද, 2012 අයවැය යෝජනා අනුව මෙතෙක් ලබාදුන් සමෘද්ධි සහනාධාරය සමෘද්ධි බැංකු සංගම් මඟින් ප්‍රතිගාහියාට මුදල් ලෙස ගෙවීම ආරම්භ කරන ලදී. වර්තමානය වනවිට දිවිනැගම වැඩසටහන යටතේ දීමනා ලබා දෙන ආකාරය පහත දැක්වේ.

වගු අංක 03: 2014 හා 15 වර්ෂවල සහනාධාර වැඩසටහන යටතේ සහනධාර බෙදී ගිය ආකාරය

| **සහනාධාර වැඩහටහන රු.** | | **අනිවාර්ය ඉතිරි කිරීම් රු.** | | **සමාජ ආරක්‍ෂණ රු.** | | **නිවාස ලොතරැයිය** | | **ප්‍රතිලාභියාට හිමිවන මුදල** | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 |
| 1500/- | 3500/ | 300/- | 300/- | 45/- | 45/- | 10/- | 10/- | 1145/- | 3145/- |
| 1200/- | 2500/ | 200/- | 200/- | 45/- | 45/- | 10/- | 10/- | 954/- | 2245/- |
| 750 /- | 1500/ | 100/- | 100/- | 45/- | 45/- | 10/- | 10/- | 595/- | 1345/- |
| 210 /- | 420/- | 155/- | 365/- | 45/- | 45/- | 10/- | 10/- | - | - |

මූලාශ්‍රය: දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, 2015

සුභ සාධන ප්‍රවේශය යටතේ ක්‍රියාත්මක වන වැදගත් වැඩසටහනක් ලෙස සමාජ ආරක්‍ෂණ වැඩසටහන සඳහන් කළ හැකිය. සමාජයේ දිළිඳු පවුල් සඳහා සමාජ ආරක්‍ෂණයක අවශ්‍යතාව වන්නේ එවැනි පවුල්වල සාමාජිකයන්ට අනපේක්ෂිතව මුහුණ දීමට සිදුවන මරණ, ලෙඩදුක් වැනි අවස්ථා මෙන් ම විවාහ, දරු උපත් වැනි විවිධ අවස්ථාවලදී ඒවාට අවශ්‍ය මුදල් වැනි විවිධ අවස්ථාවලදී ඒවාට අවශ්‍ය මුදල් ඔවුන් සතු නොවීම නිසාම එම පවුල්වල සාමාජිකයන් අධික පොළී අනුපාතයන් යටතේ ණය ලබා ගැනීම ඔවුන් සතු නොවීම නිසාම එම පවුල්වල සාමාජිකයන් අධික පොළී අනුපාතයන් යටතේ ණය ලබා ගැනීම ඔවුන්ගේ දිළිඳුබව තවත් වැඩි කිරීමට හේතුවනු ඇත. මෙයට පිළියමක් ලෙස සමෘද්ධි සමාජ ආරක්‍ෂණය 1997 වර්ෂයේදී හඳුන්වාදී ඇත(සමෘද්ධි සමාජ ආරක්‍ෂණය, 2000: 8). 1996 දී මෙම වැඩසටහන 1996 දී මෙම වැඩසටහන ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව මඟින් ක්‍රියාත්මක කිරීම අරඹන ලද නමුත් රක්‍ෂණ සංස්ථාවට මෙවැනි සමාජ ආරක්‍ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී විවිධ ගැටලු පැනනගින බව ඒත්තු ගිය නිසා එම වැඩසටහන ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවෙන් මුදවා ගෙන සමෘද්ධි කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ වෙනමම ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. මෙහිදී සමෘද්ධි සහනාධාරය මඟින් දිළිඳු ප්‍රජාවට ලබාදෙන සහනාධාරයෙන් රු. 25/-ක් අඩුකර ඒ තුළින් ආරක්‍ෂණ අරමුදලක් සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව තුළ ඇතිකර ඇත. එහිදී ගෙවීම් සිදුකිරීමේදී මරණයකට රු. 5000/-ක් ද, දරු උපතකට රු. 2000.00ක් ද, විවාහයකට රු. 3000/-ක් සහ අසනීපව ආරෝග්‍යශාලා ගතවීමකට දිනකට රු.50/- බැගින් රු.1500/- ක උපරිම ගෙවීමක් ද, කරනු ලබයි. අරම්භයේදී මෙම ආරක්‍ෂණ ක්‍රමයට ඇතුළත් කර ඇත්තේ රු.1000/-, රු. 500/-, රු. 250/- යන ප්‍රමාණයේ සහනාධාර ලබන පවුල් පමණි. ඉහත සඳහන් කරන ලද හදිසි අවස්ථාවකදී සමෘද්ධි සංවර්ධන නිලධාරි මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මෙම වන්දිය ලබා දෙනු ලබයි (මිත්‍රරත්න, 2000: 14).

වගු අංක 04: 2000 වර්ෂය වන විට සමාජ ආරක්‍ෂණ අරමුදලේ ප්‍රගතිය

| **මෙතෙක් ආරක්‍ෂණ පහසුකම් ලබා දී ඇති පවුල්** | | | |
|---|---|---|---|
| | 1997 | 1998 | 1999 |
| උපත් | 6229 | 12766 | 9673 |
| විවාහ | 10472 | 18710 | 24127 |
| ලෙඩ රෝග | 3933 | 7141 | 10960 |
| මරණ | 6620 | 11699 | 15306 |
| **එකතුව** | 27454 | 50316 | 60066 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 2000

දැනට ක්‍රියාත්මක වන සමජ ආරක්‍ෂණ ක්‍රමය දුප්පත් ප්‍රජාවට මෑත කාලයේ ලබාදී ඇති ඉතාමත් වැදගත් සුභසාධන වැඩසටහනක් ලෙස හැඳින්විය හැකිය. සමාජ ආරක්‍ෂණය පිළිබඳ සංකල්පය වර්තමාන සමාජය තුළ බෙහෙවින් ප්‍රචලිත වී ඇති අතර ඒ මාර්ගයෙන් කිසියම් අස්වැසිල්ලක් ලබා ගැනීමට ඇති හැකියාව දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. එබැවින් වර්තමානයේදී පුද්ගලයින් මුහුණපාන සමාජීය හා ආර්ථික ප්‍රශ්න හමුවේ ඒවා නිරාකරණය කරගනු වස් කිසියම් වාතාවරණයක් ඔවුන් විසින්ම ගොඩනගාගෙන ඇත. සාමූහිකව ඒකරාශීවීම තුළින් පොදුවේ සැමට බලපාන ආර්ථික හා සමාජීය ප්‍රශ්න හමුවේ ඉදිරියට යාමට මගක් ලෙස සමාජ ආරක්‍ෂණ ක්‍රමය අද බෙහෙවින් ප්‍රචලිත ආරක්‍ෂණ සංකල්පයක් ලෙස පිළිගැනේ. රක්‍ෂණයේ වරප්‍රසාද පොහොසත් සමාජයෙන් එපිට ගෙන ගොස් දුගී, දුප්පත් අයට ද එහි වරප්‍රසාද ප්‍රතිලාභ අත්කර දීම මූලික කරගෙන සමාජ ආරක්‍ෂණ අරමුදල ගොඩනැගී ඇත (සමෘද්ධි සමාජ ආරක්‍ෂණය, 2000: 7). ඒ වගේම දිවිනැගුම වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත ලබා දෙනු ලබන සමාජ ආරක්‍ෂණ මුදල ද, වැඩිකිරීමට කටයුතු කර ඇත. එහිදී පවුලේ පළමු හා දෙවන සජීවී දරු උපතකදී රු.5000ක් ද, ප්‍රතිලාභියාගේ හෝ දරුවාගේ විවාහයක දී රු.3000ක් ද, රෝහල් ගතවීමකදී දිනකට රු.200 බැගින් වර්ෂයේ උපරිම දින 30 ක් සඳහා රු.6000ක් ද ලෙස ලබා දීමට කටයුතු කර ඇත. වර්තමාන රජය මඟින් මේ ආකාරයටම මුදල් වෙන් කර ඇති අතර විවාහයකදී ලබා දෙන මුදල රු.5000 දක්වා වැඩිකර ඇත.

සුභ සාධන ප්‍රවේශය යටතේ ක්‍රියාත්මක වන තවත් වැඩසටහනක් නම් සමාජ සංවර්ධන වැඩසටහනයි. සමාජයේ අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නගින අතරම ඔවුන් සමාජීය හා සංස්කෘතික වශයෙන් ද, සංවර්ධනය කිරීම සමෘද්ධි වැඩසටහනයි. ඒ අනුව මත්ද්‍රව්‍ය නිවාරණ, ළමා සුභ සාධනය, වැඩිහිටි සුභසාධනය, ආබාධිත සුභසාධනය ආදී විවිධ සමාජ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන් ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සමාජ සංවර්ධන පදනම් පිහිටුවා ඇත. සමාජ සංවර්ධන පදනම සඳහා අරමුදල් සපයනු ලබන්නේ ජාතික මට්ටමේ කොඩි අලෙවියෙන් ලබා ගන්නා අරමුදලට ලබා සාපේක්‍ෂව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් ද 25%ක මුදලක් ලබාදීමෙනි. කොඩි අලෙවියෙන් 1998 වර්ෂය වනවිට රු. මිලියන 6.67 ක් උපයාගෙන ඇති අතර රු.මි. 1.30ක මුදලක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් ලබාදී ඇත. ඒ අනුව 1998 වර්ෂය අවසන් වනවිට රු.මි. 7.352 ක් ඉහත සඳහන් කළ සමාජ සංවර්ධන වැඩසටහන් සඳහා වැය කර තිබේ. 1999 වර්ෂයේ මැයි 31 පැවුත්වුණු ලෝක දුම්වැටි විරෝධි දිනය පදනම් කරගෙන කොඩි අලෙවියේදී රු.ලක්‍ෂ 40ක ආදායමක් ලබා ඇති අතර එම මුදල් සමාජ සුභ සාධන කටයුතු සඳහා වැය කර ඇත (ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1999: 17).

වගු අංක 05: සමාජ සංවර්ධන හා සුභසාධන වැඩසටහන්

| නැඩසටහන | 1997 | 1998 | 1999 |
|---|---|---|---|
| වැඩිහිටි සුභසාධනය | 101 | 590 | 678 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 300 | 1640 | 781 |
| ආබාධික සුභසාධනය | 61 | 490 | 318 |
| ළමා සුභසාධනය | 82 | 486 | 825 |
| කාන්තා සුභසාධනය | 94 | 558 | 398 |
| මැද පෙරදිග ගිය පවුල් සුභසාධනය | 196 | 1822 | 2663 |
| මුළු වැඩසටහන් සංඛ්‍යාව | 839 | 5785 | 5655 |
| **වැය කළ මුළු මුදල රු. මිලියන** | 3.556 | 2.393 | 1.616 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1999

2015 වර්ෂය තුළ එම සමාජ සංවර්ධන අරමුදලේ දායකත්වය ඇතිව සිදුකරන ලද සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳ විස්තරය පහත දක්වා ඇත. ඒ අනුව පැහැදිළි වන්නේ දිවිනැගුම වැඩසටහන මඟින් දිවයින පුරා සමාජ සංවර්ධන වැඩසටහන් රාශියක් සිදුකර ඇති බවයි.

වගු අංක 06: සමාජ සංවර්ධන පදනමේ අරමුදල්වලින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය

| **ක්‍රියාත්මක කළ වැඩසටහන්** | **වැඩසටහන් සංඛ්‍යාව** | **මුදල රු.** |
|---|---|---|
| මත් නිවාරණ වැඩසටහන | 1993 | 6,175,652.00 |
| ළමා ආරක්ෂණ හා සුභ සාධන | 4868 | 12,253,525.00 |
| සිසු දිරිය ශිෂ්‍යත්ව | 7602 | 15,980,251.00 |
| පාසල් නොයන දරුවන් පාසල් ගත කිරීම | 1219 | 1,788,500.00 |
| පාසල් යන දරුවන්ට පාසල් උපකරණ ලබාදීම | 3348 | 5,617,582.00 |
| සතුටු පවුල වැඩසටහන | 1138 | 1,042,000.00 |
| ආදර්ශ ගම්මාන වැඩසටහන | 179 | 543,000.00 |
| ආබාධිත සුභ සාධන වැඩසටහන් | 559 | 2,266,800.00 |
| සංස්කෘතික හා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන | 2196 | 6,682,160.00 |
| නිවාස අලුත්වැඩියා කිරීම | 795 | 14,367,583.00 |
| නිවාස ඉදි කිරීම | 288 | 14,419,175.00 |
| සමීපාරක්ෂක වැඩසටහන් | 1929 | 12,597,360.00 |
| ජාත්‍යන්තර දින සැමරීම් | 2064 | 7,189,921.00 |
| වෙනත් වැඩසටහන් | 1148 | 6,141,353.00 |
| **එකතුව** | 29289 | 108,104,862.00 |

මූලාශ්‍රය: දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, 2015

### ග්‍රාම සංවර්ධන ප්‍රවේශය

සමෘද්ධි ව්‍යාපාරය යටතේ ගම සහ ජනතාව පදනම් කරගත් සංවර්ධන උපාය මාර්ග යටතේ දිළිඳු ජන කොටස්වල සේවා වියුක්ති ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා ස්වයං රැකියා අවස්ථාවන් වර්ධනය කිරීම, අඩු ආදායම්ලාභී ජන කොටස්වල ආදායම උත්පාදන හැකියාව වර්ධනය කිරීම සහ ග්‍රාමීය යටලතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සමෘද්ධිලාභීන් සම්බන්ධ කර ගනිමින් සමෘද්ධි අධිකාරිය, දිළිඳු සහන දෙපාර්තමේන්තුව, සමෘද්ධිය සහ දිළිඳුකම පිටුදැකීමේ අමාත්‍යාංශය යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. කෘෂි සංවර්ධන වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන් අතර කෘෂි නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ දැමීමටත්, කෘෂි නිෂ්පාදන වර්ධනය කිරීම තුළින් ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ දැමීමටත්, කෘෂි අමුද්‍රව්‍ය ආශ්‍රිත සුළු පරිමාණ කර්මාන්ත අංශය තුළ ස්වයං රැකියා අවස්ථා බිහිකිරීමටත් කටයුතු කරනු ලැබේ. සත්ත්වපාලන හා ධීවර සංවර්ධන වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් ඒ කෙරෙහි යොමු කිරීමටත්, ඒ සඳහා අවශ්‍යය පුහුණුව හා දැනුම ලබා දෙමින් නව තාක්ෂණය උපයෝගී කොටගන්නා ස්වයං රැකියා අවස්ථා බිහිකිරීමටත් පියවර ගෙන ඇත. තවද සමෘද්ධි ව්‍යාපාරය යටතේ සමාජ සංවර්ධන සහ විවිධ සුභ සාධන වැඩසටහන්, අලෙවි සංවර්ධන වැඩසටහන්, සතිපොළ පැවැත්වීම, සමෘද්ධි වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවීම, ජංගම වෙළඳ කුටි සහ වෙළඳ රථ හඳුන්වා දීම, සමෘද්ධි සාක්ෂරතා වැඩසටහන, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන, සමෘද්ධි නැණ නුවණ ශිෂ්‍යත්ව වැඩසටහන, කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍යය කුඩා වැව් හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, වගා ළිං

ඉදිකිරීම, ග්‍රාමීය යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සහනාධාරලාභීන්ගේ ශ්‍රම සහභාගීත්වයෙන් ශ්‍රම සූක්ෂම ජනතා ව්‍යාපෘති වැඩසටහන වැනි ග්‍රාම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවරගෙන ඇත (හෙට්ටිආරච්චි, 2008: 7). සමෘද්ධි ව්‍යාපාරයේ ආරම්භයේ සිටම ග්‍රාම සංවර්ධනය උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

වගු අංක 07: 1995-1999 දක්වා ක්‍රියාත්මක කළ ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘති වර්ගය | 1995 | 1996 | 1997 | 1998 | 1999 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 01 | වාරිමාර්ග, ඇලවේලි, අමුණු | 1401 | 1048 | 1600 | 783 | 122 | 4954 |
| 02 | පොදු ළිං, කෘෂි ළිං, ජල යෝජනා ක්‍රම | 3232 | 3488 | 1670 | 1151 | 18 | 9559 |
| 03 | මාර්ග, පාලම්, බෝක්කු, | 4794 | 6065 | 4907 | 2902 | 42 | 18710 |
| 04 | නිෂ්පාදන, අලෙවි මධ්‍යස්ථාන ,ගොඩනැගිලි | 884 | 863 | 563 | 1017 | 17 | 3444 |
| 05 | වෙනත්/සමෘද්ධි බැංකු හා කලාප කාර්යාල | 1034 | 176 | 2548 | 208 | 15 | 3981 |
| | **එකතුව** | 11345 | 11640 | 11288 | 6061 | 214 | 40548 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1999

මේ අනුව සමෘද්ධි ව්‍යාපාරය ආරම්භයේ සිටම ප්‍රජා ව්‍යාපෘති ග්‍රාමීය ප්‍රදේශවල සිදුකරීමට කටයුතු කර ඇති බව පැහැදිළි වේ. මේ ආකාරයට සමෘද්ධි ව්‍යාපාරය මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති බොහෝමයක් කුඩා ව්‍යාපෘති නිසා ඒවා පිළිබඳ විවිධ අක්‍රමිකතා ඇතිවීම ඉතා අඩුය. ව්‍යාපෘති විශාලවීමත් සමඟ විවිධ අක්‍රමිකතා හා දූෂණවලට යොමුවීම පොදුවේ දක්නට ඇති ලක්ෂණයකි. සමෘද්ධි ව්‍යාපෘති හැකිතාක් දුප්පත් ප්‍රජාවගේ අවශ්‍යතා මත තෝරාගැනීමට උත්සහා දරා ඇත. ව්‍යාපෘති තෝරාගැනීම හා සැලසුම් කිරීම ඉතාම වැදගත්ය. සමෘද්ධි බලකාය බලප්‍රදේශය, ග්‍රාම නිලධාරි වසම වීම නිසා මෙම පිරිස් එක්රැස් කිරීමේ දුෂ්කරතාවන් ඇත. ව්‍යාපෘති තෝරාගැනීමේදී ප්‍රජා සහභාගීත්වය හා අවශ්‍යතාව හඳුනාගැනීම දුෂ්කර වී ඇත. මේ සඳහා විකල්ප දෙකක් යොදා ගෙන ඇත. මෙහිදී කුඩා ගම්මාන මට්ටමේ සමෘද්ධි සමිතිය සති දෙකෙන් දෙකට රැස්වන නිසා එම සමිති මඟින් ව්‍යාපෘති හඳුනා ගැනීමට උපදෙස් ලබා දී, ඒ අනුව කටයුතු කරගෙන යනු ලැබේ (මිත්‍රරත්න, 2000: 27). 2009 වර්ෂය තුළ ග්‍රාම සංවර්ධනය උදෙසා සමෘද්ධි ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය පහත පරිදි දැක්විය හැකිය

වගු අංක 08: විශේෂ ව්‍යාපෘති වැඩසටහන 2009 දිස්ත්‍රික් විශ්ලේෂණය

| **ව්‍යාපෘතිය** | **මුදල (රු.මි.)** | **ව්‍යාපෘති සංඛ්‍යාව** | **ප්‍රතිලාභීන් සංඛ්‍යාව** |
|---|---|---|---|
| කෘෂි මාර්ග/ පඩිපෙළ | 22,407,158.00 | 72 | 12,066 |
| පාලම් | 870,792.00 | 3 | 1,270 |
| බෝක්කු / පැතිබැමි | 596,069.00 | 2 | 775 |
| වැව් | 19,116,002.00 | 13 | 669 |
| ඇළ මාර්ග | 7,064,147.00 | 11 | 1,558 |
| අමුණු | 4,429,122.00 | 11 | 423 |
| පොදු පහසුකම්/ බහුකාර්ය මධ්‍යස්ථාන | 2,847,529.00 | 11 | 1,602 |
| පුහුණු මධ්‍යස්ථාන | 100,000.00 | 1 | 75 |
| පරිසර සංරක්ෂණ ව්‍යාපෘති | 49,940.00 | 1 | - |
| පානීය ජල ව්‍යාපෘති | 4,956,063.00 | 31 | 1,005 |
| කුඩා විදුලිබල මධ්‍යස්ථාන | 1,236,900.00 | 1 | 80 |
| සනීපාරක්ෂක පහසුකම් | 1,599,000.00 | 273 | 273 |
| පාසල් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය | 394,950.00 | 4 | 450 |
| අලෙවි සතිපොළ මධ්‍යස්ථාන | 670,800.00 | 2 | 532 |
| එකතු කිරීමේ මධ්‍යස්ථාන | 100,000.00 | 1 | 46 |
| ආගමික ගොඩනැගිලි ඉදිකිරීම | 3,661,917.00 | 13 | 1,582 |
| ජීවනෝපාය සංවර්ධනය (කෘෂි සත්ත්ව) | 1,219,020.00 | 62 | 90 |
| පුහුණු වැඩසටහන්, පරිපාලන වියදම් | 1,406,924.00 | 4 | 64 |
| **එකතුව** | 72,726,333.00 | 516 | 22,560 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 2009

**සමෘද්ධි බැංකු සංගම් ප්‍රවේශය**

සමෘද්ධි ව්‍යාපාරය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශ අතර බැංකු සංගම් ප්‍රවේශ නැතහොත් දුප්පතුන් බලගන්වන ප්‍රවේශයට ද හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මේ අනුව සමෘද්ධි ව්‍යාපාරය යටතේ දිළිඳු ජනතාවගේ ඉතිරිකිරීම් වර්ධනය කිරීම මඟින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය දියුණු කර නිෂ්පාදන සඳහා යොමු කිරීමත් එදිනෙදා ඔවුන් අතර ඇතිවන සුළු ණය අවශ්‍යතා සපුරාලීම මඟින් අවිධිමත් ණය වෙළඳපොළට ඔවුන් හසුවීම වැළැක්වීමටත්, එමඟින් ඔවුන් ණය බරින් මුදවා විධිමත් මූල්‍ය වෙළඳපලට යොමුකිරීමත් සඳහා සමෘද්ධි බැංකු සංගම් වැඩසටහන හඳුන්වා දී ඇත. මෙම වැඩසටහනේ සුවිශේෂ අරමුණු වන්නේ, ඉතිරිකිරීම් ප්‍රවර්ධනය තුළින් දිළිඳු ජනතාවගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීම, ඔවුන්ගේ හදිසි ණය අවශ්‍යතා සපුරාලීම, නිෂ්පාදන සඳහා ආයෝජනය කිරීමට අවශ්‍ය ණය පහසුකම් ලබාදීම, දුප්පතුන් ශක්තිමත් ආර්ථික සංවිධානයක් තුළට ගැනීම, දිළිඳුකමින් මිදීම සඳහා නව ආදායම් මාර්ග හඳුන්වා දීම, අවිධිමත් ණය වෙළඳපලින් ඈත්කර විධිමත් ණය වෙළඳපලට අනුගත කිරීම සහ ණය විනයක් ඇති කිරීම මඟින් බැංකු පුරුදු ඇති කිරීම ආදියයි. ග්‍රාමීය වසම් 10 ක් පමණ එක්කොට පිහිටුවා ඇති සමෘද්ධි කලාපයකට එක් බැංකු සංගමයක් වන සේ බැංකු සංගම් පිහිටුවීම 1996 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 1999 වර්ෂය වනවිට සමෘද්ධි බැංකු සංගම් 686ක් පිහිටුවා ඇත. සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණක් වූයේ දිළිඳු ජනතාවගේ අරපිරිමැස්ම හා ඉතිරිකිරීමේ පුරුදු වැඩි

කිරීමය. මේ යටතේ සමෘද්ධි දීමනා ලබන ප්‍රතිලාභීන් අනිවාර්ය ඉතුරුම් වැඩසටහනකට යටත් කරන ලදී. ඒ අනුව ආරම්භයේදී දිළිඳු සහන වැඩසටහන යටතේ මාසිකව රු.1000ක දීමනාවක් ලබන පවුලකින් රු.200 බැගින් ද, රු. 500ක දීමනාවක් ලබන පවුලකින් රු. 100 බැගින් ද, අනිවාර්ය ඉතුරුම් ගිණුමකට බැර කෙරේ. ඒ හැරුණු විට සමෘද්ධිලාභී පවුල්වල ස්වේච්ඡා ඉතුරුම් වර්ධනය කිරීමට කටයුතු කර ඇත. ග්‍රාමීය මට්ටමේ පවුල් කුඩා කණ්ඩායම් ගතකර එම කණ්ඩායම් ස්ව කැමැත්තෙන් ඉතුරුම් වශයෙන් අරමුදල් ගොඩනැංවීමට දිරිමත් කළ අතර මෙම ඉතුරුම් මඟින් එදිනෙදා එම පවුල්වල සුළු ණය අවශ්‍යතා සපුරා ගැනීමට යොදවා ගත හැකිවූ අතර ඉතිරි මුදල් සමූහ ගිණුමක් යටතේ තැම්පත් කිරීමට පහසුකම් සලසා ඇත (හෙට්ටිආරච්චි, 2008: 06). සමෘද්ධි ව්‍යාපාරය ආරම්භයේ සිට 1999 දක්වා ස්වේච්ඡා ඉතිරිකිරීම් හා අනිවාර්ය ඉතිරි කිරීම් පිළිබඳ විස්තර පහත පරිදි දැක්විය හැකිය.

වගු අංක 09: අනිවාර්ය ඉතිරිකිරීම් 1996-1999 ජූනි දක්වා

| විස්තරය | 1996 | 1997 | 1998 | 1999.06.30 |
|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව | 925985 | 918036 | 897803 | 902983 |
| සමුච්ඡිත ඉතිරිකිරීම් | 1517.54 | 25119.77 | 3764.15 | 4347.09 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 2000

වගු අංක 10: ස්වේච්ඡා ඉතිරිකිරීම් 1996-1999 ජූනි දක්වා

| විස්තරය | 1997 | 1998 | 1999.06.30 |
|---|---|---|---|
| කුඩා කණ්ඩායම් ගණන | 116565 | 183915 | 207890 |
| ස්වේච්ඡා ඉතිරිකිරීම් ප්‍රමාණය | 27134 | 40721 | 44945 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 2000

මෙම බැංකු සංගම්වල සාමාජිකත්වය ආරම්භයේ සිට වර්ධනය වී ඇත. 1997 මුළු සාමාජික සංඛ්‍යාව 267784ක් වූ අතර එය 1998 වර්ෂයේදී 612063 දක්වා 128% කින් වර්ධනය වී ඇත. මෙයට ප්‍රධානතම හේතුව වූයේ III අදියර යටතේ තවත් බැංකු සංගම් 178 ක් 1998 වර්ෂය තුළ බැංකු සංගම් පද්ධතියට අළුතින් එකතු වීමයි. 1999 ජූනි මාසය වනවිට බැංකු සංගම් සාමාජිකත්වය 881563 දක්වා වර්ධනය වී ඇත. සමෘද්ධි බැංකු සංගම් ඉතිරිකිරීමේ ගිණුම් පිළිබඳ සාකච්ඡා කිරීමේදී ළමා, දිරියමාතා, සාමාජික, සාමාජික නොවන සහ සමූහ ඉතුරුම් වශයෙන් සමෘද්ධි බැංකු සංගම් ඉතිරි කිරීමේ ගිණුම් වර්ග 5 ක් ඇත. 2005 වර්ෂය අවසාන වනවිට ශ්‍රී ලංකාව තුළ සමෘද්ධි බැංකු සංගම් 1200 ක් පමණ ක්‍රියාත්මක වූ අතර මෙම බැංකුවල සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ප්‍රමාණය රු.ද.ල 69500 ක් පමණ දක්වා වැඩිවී ඇති අතර සමෘද්ධිලාභීන්ගේ සහ අඩු ආදායම් ලබන දිළිඳු ජනකොටස්වල ස්වේච්ඡා ඉතුරුම් ප්‍රමාණය රු.ද.ල 1000 පමණ දක්වා වැඩිවී ඇත (හෙට්ටිආරච්චි, 2008: 06). පසුගිය වර්ෂ කිහිපය තුළ ඉතුරුම් පිළිබඳ විස්තරය පහත පරිදි දැක්විය හැකිය.


වගු අංක 11: තැන්පතු (සාමාජික, සාමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා)

| වර්ෂය | සංඛ්‍යාව | වර්ධනය | මුදල රු.ද.ල | වර්ධනය රු.ද.ල. |
|---|---|---|---|---|
| 2000 | 2,645,574 | 1,220,922 | 2,033.45 | 1264.50 |
| 2001 | 3,035,233 | 389,659 | 3,111.16 | 1,077.71 |
| 2002 | 3,296,569 | 261,336 | 3,857.10 | 745.94 |
| 2003 | 3,680,786 | 384,217 | 4,710.80 | 853.70 |
| 2004 | 3,989,539 | 308,753 | 5,751.81 | 1,041.01 |
| 2005 | 4,229,575 | 240,036 | 6,824.88 | 1,073.07 |
| 2006 | 4,394,498 | 164,926 | 8,131.66 | 1,306.78 |
| 2007 | 4,613,504 | 219,006 | 9,875.63 | 1,743.97 |
| 2008 | 5,081,229 | 467,725 | 11,356.79 | 1,481.16 |
| 2009 | 5,167,854 | 86,625 | 13,536.65 | 2,179.86 |
| 2010 | 5,505,853 | 337,999 | 15,906.77 | 2,370.12 |
| 2011 | 5,524,025 | 18,172 | 18,907.33 | 3,000.56 |
| 2012 | 6,206,484 | 682,459 | 20,799.06 | 1,891.73 |
| 2013 | 6,383,307 | 176,823 | 23,916,57 | 3,117.52 |
| 2014 | 6,822,409 | 439,102 | 29,436,10 | 5,519.53 |

මූලාශ්‍රය : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, 2014

මේ අනුව 2014 වර්ෂය තුළ රු.ද.ල. 5,519.53 ක මුදලක් තැම්පත් කරමින් ජනතාව බැංකු සංගමයේ මුදල් තැම්පත් කිරීම කර ඇති අතර සමෘද්ධි බැංකු සංගමයේ වැඩසටහන කෙරෙහි ජනතාව තනදුරටත් විශ්වාස තබා කටයුතු කර ඇති බව දැකිය දැකිය හැකිය. අනෙකුත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා සසඳන විට සමෘද්ධි බැංකු සංගමය විසින් මෙවන් සංවර්ධනයක් අත්පත් කරගැනීම පැසසිය යුතුය. ඒ වගේම මෙම වර්ෂ කිහිපය තළ සමෘද්ධි බැංකු සාමාජිකයන් විසින් මුදල් ප්‍රමාණයන් අනුව වර්ෂයෙන් වර්ෂයට තැම්පතු වෙනස පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.

ප්‍රස්තාර අංක 01: තැම්පතු වර්ධනය




මූලාශ්‍රය : දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව, 2014

මේ ආකාරයට දිළිඳු ජනතාවගේ ඉතුරුම් කටයුතු වර්ධනය කිරීම සඳහාත් සමෘද්ධි ප්‍රතිලාභීන්ට ආදායම් උත්පාදන වැඩසටහන් ආරම්භ කිරීමටත් දැනට පවත්වා ගනු ලබන ව්‍යාපෘති වැඩිදියුණු කර ගැනීමටත් ඔවුන්ගේ ණය අවශ්‍යතා සපුරා ගැනීමටත් ණය යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි. සමෘද්ධි ව්‍යාපාරය ආරම්භයේදී සමෘද්ධි කඩිනම් ණය නියාමක වැඩසටහන යටතේ ලංකා බැංකුව සහ මහජන බැංකු යන බැංකු දෙක මගින් සමෘද්ධිලාභීන්ට හදිසි පරිභෝජනය සඳහා ආපදා ණය වශයෙන් රු.1000ක ණය මුදලක් ලබා ගත හැකිවූ අතර මෙම ණය මුදල් පසුව ස්වයං රැකියා ණය වශයෙන් පුළුල් කර ණය මුදල් රු.5000 දක්වා වැඩිකරන ලදී. ඒ අනුව ආරම්භයේදී ලංකා බැංකුව සහ මහජන බැංකුව සමෘද්ධි සංවර්ධන ණය වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ණය වැඩසටහන යටතේ සමෘද්ධි ලාභියෙකුට රු.10000 ක උපරිමයකට යටත්ව ණයක් ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ලබාගත හැකිවූ අතර 2001 වසරේ සිට මෙම සමෘද්ධි සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ලංකා බැංකුව සහ මහජන බැංකුව මගින් රු. 5000ක ණය මුදලක් ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා ලබාගත හැකි විය. මෙම වැඩසටහන වර්තමානයේ ක්‍රියාත්මක වනුයේ සමෘද්ධි බැංකු සංගම් යටතේය(හෙට්ටිආරච්චි, 2008: 06). මේ ආකාරයට සමෘද්ධි සහනාධාරලාභීන්ගේ ආදායම් මට්ටම වැඩිදියුණු කිරීමට අදළ වන ආයෝජනවල යෙදවීම සහ ඔවුන්ගේ අනිකුත් අවශ්‍යතා සඳහා ණය ලබාදීමේ අරමුණින් විවිධ ණය වැඩසටහන් හඳුන්වාදීමට කටයුතු කරඇත. මේ යටතේ කඩිනම් ණය නියාමක වැඩසටහන, සමෘද්ධි සංවර්ධන ණය වැඩසටහන, සමෘද්ධි ව්‍යවසායකත්ව ණය වැඩසටහන, සමෘද්ධි කල්බඳු ණය වැඩසටහන සහ සුළු කර්මාන්ත ණය වශයෙන් ක්‍රියාත්මක වේ. කඩිනම් ණය නියාමක වැඩසටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ පාරිභෝගික සහ ආපදා ණය අවශ්‍යතා සඳහා මෙන්ම සංවර්ධන ණය අවශ්‍යතා සඳහාද 4.5%ක පොළී අනුපාතයක් යටතේ ණය මුදල් ලබාදෙනු ලැබේ. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් මගින් අරඹනු ලබන නව ව්‍යාපාරවලට අයත් සහ පවතින ව්‍යාපාර වැඩි දියුණු කිරීමට 10%ක පොළී අනුපාතය යටතේ සමෘද්ධි ව්‍යවසායකත්ව ණය ක්‍රමය ද, සමෘද්ධි කල්බදු වැඩසටහන යටතේ සමෘද්ධි නියාමකයින් 5000 කට 10% පොළායක් යටතේ ණය මුදල් ලබාදීම ආරම්භ කර ඇත. ආරම්භක වර්ෂ කිහිපය තුළ එම ණය වර්ග ලබාගැනීම් පිළිබඳ දත්ත පහත පරිදි දැක්විය හැකිය.

වගු අංක 12: ණය වැඩසටහන් 1996 - 1999 ජූනි දක්වා

| **ණය වැඩසටහන** | **සංඛ්‍යාව** | **වටිනාකම රු.මි.** | **නැවත අයකර ගැනීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| ඛඩිනම් | 110888 | 93 | 98% |
| සහන | 8533 | 219 | 83% |
| කල්බදු | 588 | 140 | 50% |
| සංණස | 80631 | 478 | 69% |
| **එකතුව** | 200370 | 930 | 75% |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1999

වර්මානයේ සමෘද්ධි බැංකු සංගම් යටතේ ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා රු. 100000 උපරිමයක ණයක් ලබාගත හැකිය. ඒ හැරුණු විට සීමාසහිත පීපල්ස් ලීසින් සමාගම යටතේ සමෘද්ධි කල්බඳු පහසුකම් වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර මෙම වැඩසටහන යටතේ තනි පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට රු. ලක්‍ෂ තුනක උපරිමයකට යටත්ව ලීසිං පහසුකම් ලබාගත හැකිවිය. තවද ජාතික සංවර්ධන භාරකාර අරමුදල යටතේ සමෘද්ධි ව්‍යාපාරය යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවලට මූල්‍යාධාර සපයන ලදී. මේ අනුව පැහැදිළි වන්නේ ප්‍රජාමූල බැංකු සංගම්වල සාමාජිකත්වයේ වර්ධනය කෙරෙහි මෙවැනි ණය යෝජනා ක්‍රම කෙරෙහි ජනතාව දක්වන උනන්දුවද හේතු වන්නට ඇතිබව කිව හැකිය. ඒ වගේම දිවිනැගුම වැඩසටහන මගින් ග්‍රාම සංවර්ධනය උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇතිබව මේ අනුව සඳහන් කළ හැකිය.

## නිගමනය

ශ්‍රී ලංකාවේ දුප්පත්කම අවම කිරීම සහ ග්‍රාම සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම වැඩසටහනක් ලෙස සමෘද්ධි ව්‍යාපාරය සඳහන් කළ හැකිය. මෙතෙක් පැවති සංවර්ධන වැඩසටහන්වලට වඩා වෙනස් වූ මුහුණුවරකින් ඉදිරිපත් කළ සුභසාධන සීමාවෙන් ඔබ්බට ගිය වැඩසටහනක් ලෙස මෙය හඳුනා ගත හැකිය. 1995 වර්ෂයේ සිට සමෘද්ධි අධිකාරිය යටතේත් ඉන් පසුව 2014 වර්ෂයේ සිට දිවිනැගුම දෙපාර්තමේන්තුව යටතේ දිවිනැගුම සංවර්ධන වැඩසටහන ලෙසත් දිළිඳු ජනතාවගේ සුභසාධනය මෙන්ම ග්‍රාම සංවර්ධනය උදෙසා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇති බව පැහැදිළිය. මෙවැනි වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වුව ද, මෙම වැඩසටහන් සැලසුම් කිරීමේදී බිම් මට්ටමේ අදහස් නොවිමසීම, මෙම වැඩසටහන් තුළින් දේශපාලන අභිලාශයන් ඉටුකර ගැනීමට කටයුතු කිරීම, ප්‍රතිලාභි ප්‍රජාව යැපීම් මානසිකත්වයකින් කටයුතු කිරීම, සමාජ සජීවිකරණය තුළ පවතින ගැටලු මෙන්ම ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දුර්වලතා නිසා සමෘද්ධි වැඩසටහන් තුළින් අපේක්ෂා කළ අරමුණු ඒ ආකාරයෙන්ම ග්‍රාමීය මට්ටම තුළදී ඉටුකර ගැනීමට නොහැකිවී ඇතිබව දැකගත හැකිය. කෙසේ නමුත් වර්තමානයෙත් දිළිඳු ජනයාගේ සුභසාධනය උදෙසා ක්‍රියාත්මක වන ප්‍රමුඛ වැඩසටහනක් ලෙස සමෘද්ධි ව්‍යාපාරය සඳහන් කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

ජයසිංහ, ආර්., දා.නො. *ප්‍රජා සංවර්ධනය සඳහා සමාජ වැඩ විධික්‍රම*, පොතුහැරඃ free word publishers.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව., 2014. *කාර්ය සාධන වාර්තාව-2014*,

බත්තරමුල්ලඃ නිවාස හා සමෘද්ධි අමාත්‍යංශයේ ප්‍රකාශනයකි

දිසානායක, ඩී., 2106. *දිවිනැගුම විභාග ජයමඟ*, කර්තෘ ප්‍රකාශන.

ප්‍රේමසිරි, බී. අයි. කේ., 2007. *ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාවය පිටුදැකීමේ ව්‍යාපාරයේ විකාශනය සමෘද්ධි ව්‍යාපාරය*, කැලණියඃ කැලණිය විශ්වවිද්‍යාලය.

මිත්‍රරත්න, ඩබ්ලිව්. පී., 2000. *සමෘද්ධි ව්‍යාපාරයේ ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශ*, කොළඹඃ සමෘද්ධි යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යංශයේ ප්‍රකාශනයකි.

මිත්‍රරත්න, ඩබ්ලිව්. පී., 2000. *සමෘද්ධි මහා සංගමය*, කොළඹඃ සමෘද්ධි යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යංශයේ ප්‍රකාශනයකි.

හෙට්ටිආරච්චි, උපාලි., 2008. *ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාමාර්ග*, කැලණියඃ සරසවි මුද්‍රණාලය.

www. samurdhi.gov.lk